**කාත්තන්කුඩි නගර සභාව**

**------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 03 දින විගණයට ඉදිරිපත් කර තිබූ අතර විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර 29 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කල මතය**

**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කාත්තන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

ස්ථාවර තැන්පතුවල තැන්පත් කළ රු.4 ,000 ,000 ක මුදලට තැන්පතු වර්ෂයේ පටන් ලද පොලී මුදල රු.1,471, 241 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

**----------------------------**

ලෙජරය අනුව 2015 දෙසැම්බර 31 දිනට සේවක ණය ගිණුමේ ශේෂය රු.3,637,758 ක් වුවද සේවක ණය ලේඛනය අනුව එදිනට හිඟ මුදල රු.3,736,008 ක් වූයෙන් රු.98,250 ක වෙනස සැසඳුම් කර නොතිබුණි.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

**--------------------**

ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයට ගෙවිය යුතු රු.6 ,642, 880 ක ජල සම්පාදන ගාස්තුව අවුරුදු 21 කට වැඩි කාලයක් තිස්සේ ගෙවීමට කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**----------------------------------------------------**

නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරිය) 177(2) වගන්තිය අනුව 2014 වසරේ මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීමට 2015 දෙසැම්බර 31 දක්වා කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

**------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17, 128, 498 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ඉකුත්

වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12 ,602,309 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු 4 ,526, 189 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් කළමනාකරණය**

-----------------------------

**2.2.1 සභාව සතු ඉඩම කුලියට දීම**

--------------------------------

සභාව සතු පර්චස් 15 ක වපසරිය ඇති ඉඩමක් සමාලෝචිත වර්ෂයේ දී තනි පුද්ගලයෙකුට ඇතුරුම් බ්ලොක් සෑදීමේ කර්මාන්ත මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා අවුරුදු 02 ක් වෙනුවෙන් රජයේ ප්‍රධාන තක්සේරු නිලධාරිතැනගෙන් තක්සේරු වාර්තාවක් ලබා නොගෙන රු.7,500 මාසික කුලියකට ලබා දී තිබුණි. තවද පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ අංක පීඑස්/1/05/26 හා 2009 දෙසැම්බර් 14 දින ලිපිය පරිදි ඉඩමේ වත්මන් වටිනාකමින් 25% ක් වූ මුදල මූලික ගෙවීමක් වශයෙන් ලබා ගත යුතුව තිබුණ නමුත් ඒ වෙනුවට මාස තුනක බදු කුලී මුදල වන රු.22,500 ක් මූලික ගෙවීම වශයෙන් ලබා ගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

2012 දී විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකර ගත යුතු රු.35, 376 ණය ශේෂය විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අය කර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

**3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

2010 සිට 2015 වකවානුව තුළ "පිළිසරු" මූල්‍යාධාර වැඩසටහන යටතේ ඝන අපද්‍රව්‍ය චක්‍රියකරණය කිරීම සඳහා රුපියල් 8,394,227ක පිරිවැයක් දරා චක්‍රියකරණය මධ්‍යස්ථානයක් පිහිටුවා තිබුණද ඝන අපද්‍රව්‍ය ගං වෙරළේ ගොඩ ගසා තිබූ අතර අධිකරණයේ තීන්දුව පරිදි 2015 මැයි 28 දින සිට ගං වෙරළේ ඝන අපද්‍රව්‍ය ගොඩ ගැසීම තහනම් කර තිබුණි. කෙසේ වෙතත් සභාව විසින් කුණු කසළ අඛණ්ඩව ගං වෙරළේ ගොඩ ගසන අතර මේ නිසා පාරිසරික දූෂණයක් හා විවිධ වසංගත රෝග පැතිරී යාමට ද හේතු වී තිබේ.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 16% සිට 57% දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය කළමනාකරණයෙහි ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) ආදායම් කළමනාකරණය

(ඉ) අයවැය පාලනය